**රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2012**

------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවට හෝ අරමුදලට හිමිකමක් නොමැති ඉදිකිරීම් කටයුත්තක් වෙනුවෙන් වැයකරන ලද රු.2,526,551 ක මුදලක් අරමුදලේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ගොඩනැගිලි හා උපකරණ රු.2,526,551 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) පශ්චාත් උපාධි පාඨමාලා වියදම් ලෙස ගිණුම්ගත කළ යුතු රු.400,000 ක් දේශීය පුහුණු වියදම් ලෙස ද, දේශීය පුහුණු වියදම් ලෙස ගිණුම්ගත කළ යුතු රු.65,000 ක් විදේශීය පුහුණු වියදම් ලෙස ද, ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ගණනය කිරීමේ වැරදි හේතුවෙන් පුස්තකාල පොත් සඳහාවූ ක්ෂය ගිණුම සහ ක්ෂය වෙන් කිරීමේ ගිණුම රු.31,552 බැගින් අඩුවෙන් දැක්වුණි.

(ඈ) වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු රු.55,026,631 ක් වූ පරිගණක හා උපාංග ඒ යටතේ වෙනම ගිණුමකට හර කිරීම වෙනුවට ලීබඩු හා කාර්යාලීය උපකරණ ගිණුමට හර කර තිබුණි.

**1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.61,457,369 ක් වූ ස්ථාවර වත්කම් සනාථ කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන, භෞතික සමීක්ෂණ වාර්තා යනාදිය විගණනයට ඉදිරිපත් නොකරන ලදි.

(ආ) විදේශ පුහුණු හා සම්මන්ත්‍රණ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.21,915,698 ක මුදලක් වැය කර තිබුණද, ඊට සහභාගී වූ නිලධාරීන් අවස්ථා 11 කදී තමන් ලද විදේශ පුහුණුවේ ප්‍රගතිය පිළිබඳව සකස් කරන ලද වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු.322,866,312 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.232,622,256 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.90,244,056 ක වර්ධනයක් නිරීක්ෂණය විය. අරමුදලේ දණ්ඩන ආදායම ඉකුත් වර්ෂයට වඩා සියයට 292 කින් වැඩිවීමත්, දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා වූ වියදම සියයට 23 කින් පමණ අඩුවීමත් මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට මූලික වශයෙන් බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| ආදායම | 2012 වර්ෂය | 2011 වර්ෂය | වැඩිවීම / (අඩුවීම) | | ආදායමේ ප්‍රතිශතයක් ලෙස වියදම | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2012 | 2011 |
| | රු.000 | රු.000 | රු.000 | % | % | % |
| දණ්ඩන හා අල්ලාගත් භාණ්ඩ විකුණුම් | 361,769 | 281,485 | 80,284 | 28.52 | | |
| වෙනත් ලැබීම් | 651 | 517 | 134 | 25.92 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ආදායම් එකතුව** | **362,420** | **282,002** | **80,418** | **28.52** | | |
| <u>වියදම</u> | | | | | | |
| දේශීය පුහුණු | 10,460 | 12,233 | (1,773) | (14.49) | 2.89 | 4.33 |
| විදේශීය පුහුණු | 21,916 | 30,124 | (8,208) | (27.25) | 6.05 | 10.68 |
| පශ්චාත් උපාධි | | | | | | |
| පාඨමාලා | 2,600 | - | 2,600 | ∞ | 0.72 | - |
| **එකතුව** | **34,976** | **42,357** | **(7,381)** | **17.43** | **9.65** | **15.02** |
| වෙනත් වියදම් | 4,578 | 7,023 | (2,445) | (34.81) | 1.26 | 2.49 |
| **මුළු වියදම** | **39,554** | **49,380** | **(9,826)** | **(19.90)** | **10.91** | **17.51** |
| **අතිරික්තය** | **322,866** | **232,622** | **90,244** | **38.79** | | |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රේගු පරීක්ෂණ මගින් අල්ලාගත් භාණ්ඩ සඳහා පනවන ලද දණ්ඩන හා අල්ලාගත් භාණ්ඩ විකිණීමෙන් ලද ආදායමින් සියයට 50 ක ප්‍රමාණයක් ත්‍යාග සඳහා වෙන් කිරීමෙන් පසු ඉතිරිවන සියයට 50 ක මුදලින් සියයට 40 ක් රේගු නිලධාරින්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලට බැර කරනු ලැබුවද, මෙම අරමුදලේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

(i) රේගු නිළධාරින්ගේ කළමනාකරණ සඵලතාවය වර්ධනය කිරීම සඳහා දේශය හා විදේශය පුහුණු වීම් සඳහා දරන වැය පියවා ගැනීම.

(ii) අනතුරුවලට ලක්වන නිළධාරින්ට වන්දි ගෙවීම.

කෙසේ වුවද, රේගු කළමනාකරණ සඵලතා වර්ධනය කිරීම හා නිළධාරින්ට වන්දි ගෙවීම සඳහා වූ නිශ්චිත නිර්ණායකයන් හඳුනා ගැනීමකින් තොරව මෙම අරමුදලට මුදල් වෙන් කිරීම නිසා අරමුදලේ සමුච්චිත ශේෂය වාර්ෂිකව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. ඒ අනුව, 2012 දෙසැම්බර් 31 දිනට අරමුදලේ සමුච්චිත අරමුදලේ ශේෂය රු.3,410,133,201 ක් විය. තවද, 2011 හා 2012 වර්ෂවල අරමුදලට වෙන් කළ මුදල්වල සමස්ථ උපයෝජනය පිළිවෙලින් සියයට 17.51 ක් හා සියයට 10.91 ක් විය.

(ආ) ඉකුත් වර්ෂ දෙකක වියදම්වල ස්වභාවය පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූයේ නිලධාරින් යෙදෙන විදේශ පුහුණු කටයුතුවල පිරිවැය ආවරණය කිරීම සඳහා මෙම අරමුදල මලික වශයෙන් යොදාගෙන තිබුණි. ඉකත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂය තුළ ඉපැය ආදායමින් පිළිවෙලින් සියයට 10.68 ක් හා සියයට 6.05 ක් එසේ විදේශ පුහුණු කටයුතු සඳහා වැයකර තිබුණ අතර එය එම වර්ෂවල මුළු වියදමින් පිළිවෙලින් සියයට 61 ක් හා සියයට 55 ක් විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ මුළු වියදම්වලින් විදේශ පුහුණු පිරිවැය ප්‍රතිශතාත්මකව අඩු වී තිබුණි.

(ඇ) නිලධාරින්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.2,600,000ක මුදලක් වැය කර තිබුණු අතර ඉකුත් වර්ෂය තුළදී කිසිදු මුදලක් වැය කර නොතිබුණි.

## 3.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පූජනීය ස්ථානයක ශිලා ලේඛනයක් ආරක්ෂා කර්ම සඳහා ආවරණයක් ඉදිකිරීමට රු.2,526,551 ක මුදලක් අරමුදලෙන් වැය කර තිබුණු අතර එය අරමුදලේ අරමුණුවලට පටහැනි වියදමක් වශයෙන් නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුළ තථ්‍ය හා අයවැයගත ආදායම් හා වියදම් අතර සියයට 30 ක් ඉක්මවූ විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරීක්ෂණය වූ පාලන ක්ෂේත්‍රයන්වල අඩුපාඩු පිළිබඳව වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) රේගු නිලධාරින්ගේ කළමනාකරණ සඵලතාවය වැඩි දියුණු කිරීම
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) අරමුදලේ උපයෝජනය
(ඈ) ගිණුම්කරණය
(ඉ) වියදම් පාලනය